සංශෝධන අංක 03

R. 5534


දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2876169, 011 - 2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-01-36 /01/2015

ඔබේ අංකය / உமது இல. / Your No.:

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla


දිනය / திகதி / Date: 2020.01. 24

ලේකම්

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

02|05
02|02

<u>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ධීවර සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් ධීවර නිලධාරි තනතුරට බඳවා ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධව කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MFAR/AD/2/7/1/4–(T) හා 2019.10.09 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2015.08.04 දින අනුමත කරන ලද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණය(ධීවර නිලධාරි) බඳවා ගැනීමේ පටිපාටියට මේ සමඟ ඇති ඇමුණුම් අංක 01 හි සඳහන් සංශෝධනයන් එක් කිරීමට <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2020.01.23** වන දින තීරණය</u> කර ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

අත්/කළේ: ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්:
1) ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
2) අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
3) ආයතන අධ්‍යක්ෂ ජනරාල්

සංශෝධන ලැයිස්තුව

ඇමුණුම 01

| අනු අංකය | ඡේද අංකය | සංශෝධන විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 7.3.2.1 | i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ධීවර විද්‍යාවට අදාල විෂයන්ගෙන් උපාධියක් ලබා, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>හෝ<br><br>ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ධීවර විද්‍යාවට අදාල විෂයන්ගෙන් උපාධියක් ලබා, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර සමාජ සංවර්ධන සහකාර තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>හෝ<br><br>iii. ධීවර හා ජලජ දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>හෝ<br><br>iv. ධීවර හා ජලජ දෙපාර්තමේන්තුවේ ධීවර සමාජ සංවර්ධන සහකාර නිලධාරි තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>ලෙස සංශෝධනය කරන්න. |